# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | ඉතිහාසය | 6 ඒකකය |
|---|---|---|

**ඓතිහාසික දැනුම සහ එහි ප්‍රායෝගික ආදේශනය**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. ඓතිහාසික යුගයේ සමාජ සංවිධානයේ දැකිය හැකි ප්‍රධානම ලක්ෂණයක් වන්නේ,
    (1). පුද්ගල සම්බන්ධතාවල අනුපිළිවෙලක් තිබීමයි.
    (2). සමාන්තර බලයෙන් යුත් ව්‍යුහ සමාජයේ තිබීම.
    (3). රජු බෝසත් ගුණයෙන් යුක්ත වීම.
    (4). සාමාන්‍ය ජනතාව සිටීම.

02. අතීතයේදී ''රද්කොල් සමදරු'' යන යෙදුම භාවිත කර ඇත්තේ,
    (1). මහා සංඝරත්නය හැඳින්වීමටය
    (2). රාජකීය නිලධාරීන් හැඳින්වීමටය
    (3). වෛද්‍යවරුන් හැඳින්වීමටය
    (4). රටේ සාමාන්‍ය ජනතාව හැඳින්වීමටය

03. රජයට අනුශාසනා කරමින් සමාජ ධූරාවලියේ ඉහළ ස්ථානයක වැඩ වදාළේ,
    (1). සාමාන්‍ය නිලධාරීන්
    (2). රාජකීය නිලධාරීන්
    (3). මහා සංඝරත්නය
    (4). කුඩීන්

04. සමාජයේ පහළ මට්ටමේ සිටින්නේ කවුරුන්ද?
    (1). කුඩීන්
    (2). දාසයෝය
    (3). කම්මල්කරුවන්
    (4). සාමාන්‍ය නිලධාරීන්ය

05. ''අන්වයාතදාස'' යනුවෙන් හඳුන්වන්නේ,
    (1). රාජකීය නිලධාරීන්
    (2). කුඩීන්ය
    (3). පාරම්පරිකව දාසයන් ලෙස ගතකළ අය
    (4). කුලියට ලබාගත් දාසයන්ය

06. කුලියට ලබාගත හැකි දාසයෝ අතීතයේදී හැඳින්වූයේ,
    (1). ධනක්කිතදාස (2). අන්වයාතදාස (3). කුඩීන් (4). රද්කොල්

07. ''වදාළ'' සහ ''සභාව'' යන වචන දෙක ගැන කියවෙන සෙල්ලිපිය කරවූයේ,
    (1). මහසෙන් රජතුමා
    (2). නිශ්ශංකමල්ල රජතුමා
    (3). IV වන උදය රජතුමා
    (4). මානවම්ම රාජවංශයේ රජවරුන්ය

08. සෙල්ලිපිවල ''සභාව'' යනුවෙන් අදහස් කර තිබෙන්නේ,
    (1). අධිකරණයයි
    (2). රාජසභාවයි
    (3). ලේකම්වරුන්ය
    (4). දසගම්ඇත්තන්ය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

09. ක්‍රි.ව. 9 වන සියවසේ සෙල්ලිපිවල නීති නියාමනය කරන ආරක්ෂක නිලධාරීන් හැඳින්වූයේ,
   (1). මේකාප්පර් හෝ දණ්ඩනායක වශයෙනි
   (2). මතරමජිබක හෝ බොජකපති වශයෙනි
   (3). දකපති හෝ ලේකම් ලෙසය
   (4). කොතුරුගැනා හෝ බතගු ලෙසය

10. පළමුවන ගජබාහු රජුගේ සිතුල්පව්වේ පිහිටුවා ඇති සෙල්ලිපියක දැක්වෙන්නේ,
   (1). වරායන්වලින් රේගු බදු අයකළ බවය
   (2). වැව් පරිපාලනය හා රජයේ ඉඩම් පරිහරණය
   (3). එම ප්‍රදේශයේ විනිශ්චය ශාලාවකින් ලැබෙන දඩ මුදල් සිතුල්පව්ව වාසය කළ භික්ෂූන් වහන්සේලාට පූජා කළ බවයි
   (4). මෙරට ක්‍රමවත් අධිකරණ පද්ධතියක් පැවතුන බවයි

11. පළමුවන විජයබාහු රජුට සතුරු කරදර පැමිණි අවධියේ ආරක්ෂාව ලබාදුන් දණ්ඩනායකයකු ගැන සඳහන් වන්නේ,
   (1). වල්ලිපුරම් රන්පතයි
   (2). පනාකඩුව තඹ සන්නසයි
   (3). ගොඩවාය ටැම් ලිපියයි
   (4). සොරබොරවැව සෙල්ලිපියයි

12. ක්‍රි.ව. 9 වන සියවසට අයත් කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේ සඳහන් වන්නේ,
   (1). පොහොය දිනවල වෙළඳාම් කළ අයකුගෙන් දඩයක් වශයෙන් තෙල් බද්දක් ලබාගත යුතු බවයි
   (2). එළහරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැනවීම
   (3). අපරාධ නීතිය සම්බන්ධයෙන්ය
   (4). නිසි කලට සීසෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කිරීම

13. වෙස්සගිරියේ සෙල්ලිපියකට අනුව වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල සිහිනැටි වී මිස මුංඇට වැපිරීම නොකළ යුතු බවට නීතියක් පැනවූයේ,
   (1). IV වන උදය රජතුමා
   (2). IV වන මහින්ද රජතුමා
   (3). V වන මිහිඳු
   (4). අමණ්ඩ ගාමිණී අභය

14. පහත දැක්වෙන (අ) කොටසෙන් දැක්වෙන බදුවර්ග අයකරන ලද්දේ කුමක් සඳහාද යන්න (ආ) කොටසින් ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| i. දකපති | A. හේන්වලින් අයකළ බද්ද |
| ii. බොජකපති | B. මත්ස්‍යයින් ඇල්ලීම සම්බන්ධයෙන් අයකළ බද්ද |
| iii. මතරමජිබක | C. වැව්වලින් ජලය භාවිත කරන්නන්ගෙන් අයකළ බද්ද |
| iv. කැතිඅඩ, කෙටුකනබ | D. රජුට අයත් ඉඩම්වල වගාකිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද |

   (1). DCBA (2). CDBA (3). CDBA (4). ACBD

15. නිසිකලට සීසෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කිරීම සම්බන්ධයෙන් නීතියක් සඳහන් කර ඇති සෙල්ලිපිය වන්නේ,
   (1). කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය
   (2). වෙස්සගිරිය සෙල්ලිපිය
   (3). නැට්ටුක්කන්ද සෙල්ලිපිය
   (4). සිතුල්පව්වේ සෙල්ලිපිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

16. මාඝාත නීතිය පනවන ලද්දේ,

(1). V වන මිහිඳු රජුය
(2). නිශ්ශංකමල්ල රජුය
(3). IV වන මිහිඳු රජුය
(4). අමණ්ඩ ගාමිණී අභය රජුය

- **පහත සඳහන් සිදුවීම් ඇසුරින් නිවැරදි පිළිතුර තෝරන්න.**

A. මීහරකුන්, එළහරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැනවීම.
B. අපරාධකරු අල්ලා ගන්නාතුරු ගම්වැසියන් විසින් රජයට බද්දක් ගෙවිය යුතුයි.
C. කැලෑවල ගස්කොළන් නොකැපිය යුතුයි. (වල්වල දඬුපත් නොකපනු ඉසා)
D. උස් ගොඩබිම්වල කැලෑ නොකැපිය යුතුයි.

17. ගෘහදණ්ඩ නීතියේ දක්වා ඇත්තේ,

(1). D ය (2). A ය (3). C ය (4). B ය

18. තුන්වන උදය රජුගේ බුද්ධන්හෙල සෙල්ලිපියේ සඳහන් කරුණක් වන්නේ,

(1). A (2). B (3). C (4). D

19. පාංශුබාදනය වැළැක්වීමට හතරවන මිහිඳු රජතුමා අනුරාධපුර පුවරු ලිපියේ දක්වා ඇති නීතියකි.

(1). A (2). B (3). C (4). D

20. මෙරට කාසි භාවිතය ආරම්භ වන්නේ,

(1). ක්‍රි.පූ. 250 දීය
(2). ක්‍රි.ව. 25 දීය
(3). ක්‍රි.පූ. 225 දීය
(4). ක්‍රි.පූ. 210 දීය

21. මෙරට මුලින්ම භාවිත කරන ලද කාසි විශේෂය වන්නේ ඉන්දියාවේ සිට වෙළඳුන් ගෙන ආ

(1). හස්එබු කාසිය
(2). නානක කාසිය
(3). ස්වස්තික කාසිය
(4). ධරනා කාසිය

22. හස්එබු කාසියට භාවිත කරන ලද තවත් නමකි

(1). ධරණය (2). ස්වස්තිකය (3). පුරාණය (4). කහවණු

23. මෙරට නිපදවූ ස්වාධීන කාසියකි

(1). කහාපණ (2). කහවණු (3). පුරාණය
(4). ඇතෙකුගේ සහ අලියෙකුගේ රූකම් දක්වා ඇති කාසියකි

24. කාසි අච්චු ගැසීමේ කටයුතු භාරව කටයුතු කළ නිලධාරියෙකි.

(1). අසඅදෙක (2). පනඅදෙක (3). රූපදක (4). කනපෙඩික

25. කැණීම් කටයුතුවලදී ''රන් දෙවිසි කළඳ'' යනුවෙන් ලියා තිබුණු රන්ලෝහ කැබැල්ලක් සොයා ගන්නා ලද්දේ,

(1). මහාවිහාරයෙනි
(2). අභයගිරි විහාර සංකීර්ණයෙනි
(3). ආලාහන පිරිවෙනෙනි
(4). ජේතවනාරාමයෙනි


agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

26. දහඅටවන සියවසට අයත් සෙල්ලිපියක අනුරාධපුරයේ පිහිටා තිබූ වීරාංකුර නම් පන්සලක භික්ෂූන් වහන්සේලාට රන් කළං 200 ක් පූජා කළ රජතුමා ලෙස සැලකෙන්නේ,

(1). I වන කාශ්‍යප රජතුමා
(2). IV වන කාශ්‍යප රජතුමා
(3). IV වන මිහිඳු රජතුමා
(4). VI වන උපතිස්ස රජතුමා

27. තෙවරක් මෙරට පාලනය කළ රැජිණ ලෙස සැලකෙන්නේ,

(1). ලීලාවතී රැජිණයි
(2). කල්‍යාණවතී රැජිණයි
(3). සුගලා දේවියයි
(4). තලතා දේවියයි

28.

| (අ) | (ආ) |
|---|---|
| i. සහස්සවත්ථුප්පකරණය | A. අශෝකමාලා රසවත් ලෙස ආහාර පිස ප්‍රසිද්ධ වූ බව |
| ii. සද්ධර්මාලංකාරය | B. තමන්ගේ දියණිය සූපශාස්ත්‍රයේ නිපුනකරවීම වගකීමක් බව |
| iii. ධම්පියාඅටුවා ගැටපදය | C. සැමියා එනතුරු හුදකලාව සිටින කාන්තාවන් ගැන සඳහන්වේ. |
| iv. රසවාහිනිය | D. සූපශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් ''මධුපාචිකා'' යන ගෞරව නාමයෙන් හැඳින්වීම |

ඉහත (අ) කොටස (ආ) කොටස හා ගැලපූ විට පිළිතුර වන්නේ,

(1). BADC (2). ACDB (3). DCBA (4). BACD

29. ක්‍රි.පූ. 1129 තරම් ඈත කාලයකදී කාන්තාවන් විසින් තමන්ගේ ඇස්පිහාටු වර්ණගැන්වීම සඳහා භාවිත කරන ලද ලෝහ කූරක් හමුවූයේ,

(1). ඉබ්බන්කටුවෙනි
(2). බෙරගලෙනි
(3). උඩරංචාමඩමෙනි
(4). ජේතවන කැණීම්වලින්ය

30. ඓතිහාසික යුගයේදී ආහාර සඳහා බහුලව භාවිතා වූ ධාන්‍ය වර්ග වූයේ,

(1). උඳු, මුං (2). වරු, යව (3). අමු, මෙනේරි (4). වී, කුරක්කන්

31. ක්‍රි.ව. 12 වන සියවස වන විට ශ්‍රී ලංකාවේ ප්‍රභූවරුන් අතර ජනප්‍රියව පැවති ආහාරයකි,

(1). සුවඳ ගිතෙල්වලින් පිසූ මොනර මස්
(2). කාඩි ඇඹුල
(3). මොනර මස් සහ ඇල් හාලින් සෑදූ බත්
(4). අත්සුණු

32. i. දුගී ජනයා අතර සුලභ ආහාරයකි.
ii. සහල් පිටි පල්කර සාදා ගන්නා ලද ඇඹුලකි.
iii. දියාරු නොවූ අතින්ගෙන අනුභව කළ හැකි පදමට සකස් කරගත් ව්‍යංජනයකි
iv. ධාන්‍ය වර්ග බැද කුඩුකොට සාදා ගන්නා ලද ආහාරයකි.

ඉහත සඳහන් ලෙස සාදාගන්නා ලද ආහාර වර්ග අතීතයේදී හැඳින්වූ නම්වලින් පිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1). කාඩි ඇඹුල, නියඹලාව, පලා මාළුව, අත්සුණු
(2). කාඩි ඇඹුල, පලා මාළුව, නියඹලාව, අත්සුණු
(3). පලා මාළුව, කාඩි ඇඹුල, නියඹලාව, අත්සුණු
(4). පලා මාළුව, කාඩි ඇඹුල, අත්සුණු, නියඹලාව

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

33. ඈත අතීතයේ රෝගීන්ට දෙන ලද කැඳ වර්ග හැඳින්වුයේ,

(1). යවාගු (2). හඹු (3). ඇඹුල් කැඳ (4). උළුකැඳ

34. ආනම, අඹුල, තියඹලාව යනු,

(1). අල වර්ගය

(2). දියාරු නොවූ අතින් ගෙන අනුභව කළ හැකි පදමට සකස් කරගත් ව්‍යංජනයකි

(3). එළවළු පිසීම සිදුකරන ලද ආකාර 3 කි

(4). ආහාර පිසීමට යොදා ගන්නා ලද තෙල්ය

35. සද්ධර්මරත්නාවලියේ සඳහන් ඉතා රසවත් ලෙස සැකසූ කැඳ වර්ගයකි,

(1). ලුණුකැඳ (2). උළුකැඳ (3). ඇඹුල්කැඳ (4). කොළකැඳ

36. ජලාශවල පක්ෂීන් නොමැරිය යුතු බවට නීතියක් පැනවූයේ,

(1). හතරවන මිහිඳු රජුය

(2). අමණ්ඩ ගාමිණී අභය රජුය

(3). හතරවන උදය රජුය

(4). නිශ්ශංකමල්ල රජුය

37. විනිමය කටයුතුවලදී ලෝහ බර වට්නාකමක් සේ භාවිත වූ බවට සාක්ෂි ලැබෙන්නේ,

(1). ආලහන පිරිවෙනෙනි

(2). ජේතවන විහාරයෙනි

(3). මහාවිහාරයෙනි

(4). අභයගිරි විහාරයෙනි

38. අතීත සමාජයේ කිරි පරිභෝජනය පැවති බව පෙන්වාදෙමින් තම දියණියට හරක් බානක් තෑගි කිරීමට අදහස් කරන පියෙකු පිළිබඳ තොරතුරු සඳහන්වන ග්‍රන්ථය කුමක්ද?

(1). සිදත් සඟරාව

(2). ලෝකෝපකාරය

(3). සද්ධර්මරත්නාවලිය

(4). පූජාවලිය

39. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කොක්ඇබෙ සෙල්ලිපියේ දක්වා ඇත්තේ,

(1). එකල සිටි කාන්තාවන් රූසපුව අලංකාර කර ගැනීමට කැමැත්තක් දක්වා ඇති බවයි.

(2). අවුරුදු දහසයේදී ඇය විවාහය සඳහා සුදුසුකම් ලබන බවයි.

(3). කාන්තාවන් මහත් යස ඉසුරු ලබා ඇති බවයි.

(4). තලතා ලක්ෂ්මී නම් කාන්තාව භාතිකාභය රජ සමයේ තම දේපොලවලින් කොටසක් බෞද්ධ විහාරාමවලට පූජා කළ බවයි.

40. ඓතිහාසික යුගයේ පැරැන්නන් අනුභව කළ දේශීය ආහාර නිරෝගීභාවය පිළිබඳව දැක්විය හැකි හොඳම සාක්ෂියක් වේ. ඒ අනුව ජනතාවගේ දිනයේ මුල්ම ආහාරය ලෙස සඳහන්වන්නේ,

(1). තියඹලාව

(2). කොළකැඳ පානය

(3). දීකිරි

(4). තම්බාගත් එළවළු

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

## II කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පහත දක්වා ඇති ලංකාවේ ඓතිහාසික වැදගත්කමින් යුත් ස්ථාන ලංකා සිතියමක ලකුණු කර දක්වන්න.

හම්බන්තොට, අම්බලන්තොට, ගොඩවාය, වෙස්සගිරිය, බදුල්ල, සොරබොරවැව, හෝපිටිගම, ලාහුගල, රත්නපුරය, උඩරංචාමඩම, දඹුල්ල, කිතුල්ගල, බෙලිලෙන, තෝණිගල, අනුරාධපුරය, මහනුවර, ඉබ්බන්කටුව, සිතුල්පව්ව

චීනය, අරාබිය, රෝමය, ඉන්දියාව, ඕලන්දය, බ්‍රිතාන්‍යය (ල.12)

02. පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියා දක්වන්න.

A. සොරබොරවැව සෙල්ලිපිය කරවන ලද රජතුමා කවුරුන්ද?

B. කිසිම සතෙකු නොමැරිය යුතු බවට මුල්වරට නීතියක් පනවන ලද රජතුමා කවුරුන්ද?

C. සොරකම් කිරීම, මිනීමැරීම ආදී වරදවල් සඳහා දියයුතු දඬුවම එල්ලා මැරීමය යන අපරාධ නීතිය සම්බන්ධයෙන් පුළුල්ව විස්තර කොට ඇති වේවැල්කැටිය සෙල්ලිපිය කරවන ලද රජතුමා කවුරුන්ද?

D. ක්‍රි.ව. 10 වන සියවසට අයත් සෙල්ලිපියකට අනුව අනුරාධපුරයේ පිහිටා තිබූ විහාරයකට වීරාංකුර වහිව් හැඳින්වූ විහාරයකට රන් කළං 200 ක් පූජා කළ බවට සැලකෙන රජතුමා කවුරුන්ද?

(2 × 4 = 8)

03. පහත දී ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(අ). A. මෙහි දැක්වෙන කාසිය මගින් නිරූපිත රූකම් මොනවාද?

B. මෙය භාවිත කරන ලද කාලවකවානුව කුමක්ද?

C. මෙමගින් තහවුරු වන ප්‍රධාන කරුණ කුමක්ද?

D. මෙම කාසි මගින් හෙළිවන තාක්ෂණික මූලධර්ම මොනවාද?

(ල.04)



(ආ). A. මෙම පින්තූරයෙන් නිරූපනය වන්නේ මොනවාද?

B. මේවා සොයාගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ කවර නගරයෙන්ද?

C. මෙමඟින් හෙළිදරව් වන කරුණු මොනවාද?

D. මේවා අයිතිවන්නේ කුමන ඓතිහාසික මූලාශ්‍රවලටද?

(ල.04)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

04. (අ). සමාජ ධූරාවලියක සමාජයේ ප්‍රභූන් ලෙස සැලකෙන පිරිසට උදාහරණ 3 ක් දෙන්න. (ල.03)

(ආ). හෝපිටිගම සෙල්ලිපියේ සඳහන් නීති 2 ක් ලියන්න. (ල.04)

(ඇ). පැරණි සමාජය යහපත් ලෙස පවත්වාගෙනයාම සඳහා රජවරුන් පනවන ලද නිති සඳහා උදාහරණ දෙමින් ඒවා තුළින් සමාජයේ පැවැත්ම ආරක්ෂා වූ ආකාරය පැහැදිලි කරන්න. (ල.05)

(ඈ). අතීතයේ පරිසරය ආරක්ෂා කරමින් කෘෂිකාර්මික කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා රජවරුන් ක්‍රියාකළ ආකාරය පැහැදිලි කරන්න. (ල.06)

05. (අ). අතීතයේ මෙරට පාලනය කළ රාජකීය කාන්තාවන් තිදෙනෙකු නම් කරන්න. (ල.03)

(ආ). රාජකීය කාන්තාවන් හැරුණු විට අතීතයේ සාමාන්‍ය කාන්තාවන්ද නායකත්වය දැරූ බවට උදාහරණ 2 ක් ලියන්න. (ල.04)

(ඇ). පුරාණ කාලයේ මෙරට විසූ කාන්තාව සමාජයේ මහත් ගෞරවාදරයට ලක්වූ බවට උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල.05)

(ඈ). පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු වඩාත් කාර්යක්ෂම කරගැනීමට මුදල් හා විනිමය කටයුතු පවත්වාගෙන ගිය ආකාරය කරුණු 3 ක් ඔස්සේ පැහැදිලි කරන්න. (ල.06)

06. (අ). මෙරටින් දැනට හමුව ඇති විදේශීය කාසි වර්ග 3 ක් ලියන්න. (ල.03)

(ආ). ඓතිහාසික යුගයේ බහුලව භාවිතා වූ ධාන්‍ය වර්ග 4ක් ලියන්න. (ල.04)

(ඇ). පහත සඳහන් ආහාර වර්ග සඳහා පුරාණ වැසියන් භාවිත කරන ලද දේ සඳහා උදාහරණ 2 බැගින් ලියන්න.

A. ධාන්‍ය වර්ග

B. දුගී ජනයා අතර සුලභ වූ ආහාර

C. එකළ භාවිත කළ එළවළු

D. කුළුබඩු වර්ග

E. ආහාර රසගැන්වීමට යොදාගත් ඇඹුල් වර්ග (ල.05)

(ඈ). පැරණි ශ්‍රී ලාංකිකයෝ තම නිරෝගීතාවය පවත්වා ගෙන යාම සඳහා තම ආහාර සකසා ගත් ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල.06)

07. (අ). සමාජ ධූරාවලියක් යනු කුමක්ද? (ල.03)

(ආ). පැරණි කාන්තාව තම රූසපුව අලංකාර කර ගැනීමට උනන්දු වූ බවට තහවුරු කළහැකි සාක්ෂි හමුවන ස්ථාන 2 ක් ලියන්න. (ල.04)


(ඇ). රටක පාලන කටයුතු මැනවින් සංවිධානය කිරීමට සමාජ ධූරාවලියක් ඉවහල්වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල.05)

(ඈ). පරිසරය ආරක්ෂා කර ගැනීමට පැරණි කාලයේ අප සතුව සංවිධානාත්මක වැඩපිළිවෙලක් තිබූ බව දරුණු 3 ක් ඔස්සේ උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල.06)

*සැකසුම: එම්.ජී.එස්. දිල්රුක්ෂි කුමාරි මිය*


Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



Agaram.LK - Keep your dreams alive!